*සැ. යු.* - 2024.03.28 වැනි දින පළ වූ අංක 2378 *ගැසට් පත්‍රයේ* VI කොටසේ ඉංග්‍රීසි භාෂාවෙන් පළ වූ ලියාපදිංචි පශු වෛද්‍යවරුන්ගේ සහ වෘත්තිකයන්ගේ නාමාවලියේ ලියාපදිංචි දිනය 2020.07.20 ලෙස සඳහන් වී ඇත. එම දිනය 2024.03.01 ලෙස නිවැරදි විය යුතුය.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,380 - 2024 අප්‍රේල් මස 10 වැනි බදාදා - 2024.04.10**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| | | පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| තනතුරු-ඇබෑර්තු .... ... ... | — | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — | අයවැය ලේඛන ... ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... ... | — | දේපළ විකිණීම් ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 408 | විවිධ දැන්වීම් ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — | | |


*සැ. යු.*- අල් ෆලාහ් පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත, 2024 මාර්තු මස 28 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

### සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12 00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට්* පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2024 මැයි 03 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 අප්‍රේල් 19 වැනි දින දහවල් 12 00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පළාත් පාලන නිවේදන

## මීගමුව මහා නගර සභාව

ගෝඝාතක ආඥාපනතේ (272) වන අධිකාරය යටතේ විරෝධතා කැඳවීම

මීගමුව මහා නගර සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්යය, කර්තව්‍ය ඉටු කරන, මීගමුව මහා නගර සභාවේ නාගරික කොමසාරිස්, ඩබ්. ඒ. ඩී. ප්‍රභාත් ලක්ෂ්මන් වන මම මහා නගර සභා ආඥාපනතේ 286 (අ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2024 වර්ෂය සඳහා මෙහි පහත උපලේඛනයේ සඳහන් ස්ථානයේ ගවමස් හා ඌරු මස් විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම සඳහා ඉල්ලීමක් මා වෙත ඉදිරිපත් කර ඇති බැවින්, එම බලපත්‍රය ලබා දීම පිණිස මීගමුව මහා නගර සභා බල ප්‍රදේශය තුළ පදිංචි හා ජීවත්වන අයවළුන් විරුද්ධ වන්නේ නම්, ඔහු හෝ ඇය එසේ විරුද්ධ වන්නේ කුමන හේතුවක් පදනම් කරගෙන යන්න පිළිබඳ විස්තර ලිඛිතව පිටපත් 02 කින් යුක්තව මෙම දැන්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV(ආ) කොටසේ පළ වූ ද සිට දින 14 ක් ඇතුළත ලියාපදිංචි තැපෑලෙන් නාගරික කොමසාරිස් නමට එවිය යුතු බව ගෝ ඝාතක ආඥාපනතේ (272) වන අධිකාරය 7(2) වගන්තිය යටතේ දැනුම් දෙනු ලැබේ.

ඩබ්. ඒ. ඩී. ප්‍රභාත් ලක්ෂ්මන්,
නාගරික කොමසාරිස්,
මහා නගර සභාව,
මීගමුව.

2024 මාර්තු මස 27 වැනි දින,
මීගමුව මහා නගර සභා කාර්යාලයේ දී ය.

### උපලේඛනය

| | | |
|---|---|---|
| ඉල්ලුම්කරුගේ නම | - | එස්. එම්. කේ. ඇන්ටනී රොෂාන් |
| මස් වෙළඳාම පවත්වාගෙන යාමට යෝජිත ස්ථානය | - | අංක 70, කනත්ත පාර, කුඩාපාඩුව. |
| වෙළඳාමේ ස්වභාවය | - | ගවමස් හා ඌරු මස් වෙළඳාම |

04-168

---

## මීගමුව මහා නගර සභාව

ගෝඝාතක ආඥාපනතේ (272) වන අධිකාරය යටතේ විරෝධතා කැඳවීම

මීගමුව මහා නගර සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්යය, කර්තව්‍ය ඉටු කරන, මීගමුව මහා නගර සභාවේ නාගරික කොමසාරිස්, ඩබ්. ඒ. ඩී. ප්‍රභාත් ලක්ෂ්මන් වන මම මහා නගර සභා ආඥාපනතේ 286 (අ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2024 වර්ෂය සඳහා මෙහි පහත උපලේඛනයේ සඳහන් ස්ථානයේ ගවමස් විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම සඳහා ඉල්ලීමක් මා වෙත ඉදිරිපත් කර ඇති බැවින්, එම බලපත්‍රය ලබා දීම පිණිස මීගමුව මහා නගර සභා බල ප්‍රදේශය තුළ පදිංචි අය විරුද්ධ වන්නේ නම්, ඔහු හෝ ඇය එසේ විරුද්ධ වන්නේ කුමන හේතුවක් පදනම් කරගෙන යන්න පිළිබඳ විස්තර ලිඛිතව පිටපත් 02 කින් යුක්තව මෙම දැන්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV(ආ) කොටසේ පළ වූ ද සිට දින 14 ක් ඇතුළත ලියාපදිංචි තැපෑලෙන් නාගරික කොමසාරිස් නමට එවිය යුතු බව ගෝ ඝාතක ආඥාපනතේ (272) වන අධිකාරය 7(2) වගන්තිය යටතේ දැනුම් දෙනු ලැබේ.

ඩබ්. ඒ. ඩී. ප්‍රභාත් ලක්ෂ්මන්,
නාගරික කොමසාරිස්,
මහා නගර සභාව,
මීගමුව.

2024 මාර්තු මස 27 වැනි දින,
මීගමුව මහා නගර සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| | | |
|---|---|---|
| ඉල්ලුම්කරුගේ නම | - | මොහමඩ් හලම් මොහොමඩ් |
| මස් වෙළඳාම පවත්වාගෙන යාමට යෝජිත ස්ථානය | - | අංක 38, විස්ත්‍රීන් මාවත, මීගමුව |
| වෙළඳාමේ ස්වභාවය | - | ගවමස් වෙළඳාම |

04-172

---

**නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව**

2024 වර්ෂයට අදාළව වරිපනම් බදු පැනවීම

නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවේ ලේකම් ජේ. ඒ. එස්. උදයසිරි වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 134 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව 2024 වර්ෂයේ පෙබරවාරි මස 05 වැනි දින තීරණ අංක NPE/2024/02/05/35 යටතේ පහත දැක්වෙන තීරණය මා විසින් ගන්නා ලද බව මෙයින් නිවේදනය කරමි.

ජේ. ඒ. එස්. උදයසිරි,
ලේකම්,
නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව.

2024 වර්ෂයේ පෙබරවාරි මස 05 වැනි දින,
නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**තීරණය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි වගන්තියේ (1) වන උපවගන්තියෙන් නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දියුණු කළ ප්‍රදේශයක් යැයි ප්‍රකාශිත ප්‍රදේශය ඇතුළත පිහිටි ගොඩනැගිලි, ඉඩම්වල, ගෙපත්වල, නිශ්චල දේපළ සඳහා 2024 වර්ෂයේ දී සඳහන් කරන ලද තක්සේරුව 2024 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

එම තක්සේරුව මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව එකී දේපළ මත ඉහත කී වාර්ෂික වටිනාකමින් සියයට තුනක (3%) වරිපනම් බද්දක් අය කළ යුතු බවටත් ලේකම් ලෙස මම තීරණය කරමි.

තවද, 2024 වර්ෂය සඳහා පනවන ලද ඒ වරිපනම් බද්ද මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන සෑම කාර්තුවක් තුළ දී සමාන වාරික හතරකින් නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත්, වැඩිදුරටත් තීරණය කරන අතර, 2024 වර්ෂය සඳහා වන සම්පූර්ණ වරිපනම් බද්ද ගාස්තු 2024 වර්ෂයේ ජනවාරි 31 වැනි දිනට හෝ එදිනට පෙර නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ වරිපනම් බද්ද ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, එක් එක් කාර්තුවට අදාළ වරිපනම් බද්ද ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දින හෝ එදිනට මත්තෙන් නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් ඒ එක් එක් කාර්තුවේ වරිපනම් බදු ප්‍රමාණයෙන් සියයට පහක (5%) වට්ටමක් ද ලබා දීමට මම තීරණය කරමි.

04-241

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.